46

Article 12(1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2018-03-28 |
|---|---|---|

පැමිණිලිකරු : එම්.ජේ.එම්.මන්සූර් මයා,
නො : 379/1, පාසල පාර,
දෙහිගස්තලාව, බලන්ගොඩ.

වගඋත්තරකරු : 01. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. ලේකම්,
සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
රත්නපුර.

පැමිණිලි අංකය : **HRC/398/14**

පැමිණිල්ල :-

උක්ත පැමිණිලිකරු විසින් සිය පැමිණිල්ල මගින් සඳහන් කර සිටින්නේ සිය රාජකාරි වැඩ භාර ගැනීමට විරුද්ධව කටයුතු කිරීම හා තර්ජනය කර පහරදීමට කටයුතු කිරීමෙන් තමන්ට අසාධාරණයක් සිදුවූ බවත් සිදුවූ වෘත්තීමය හා මානසික බිඳ වැටීම පිළිබඳ සොයා බලා කඩිනමින් සාධාරණ විනය ක්‍රියා මාර්ගයක් ලබාදීමට කටයුතු කරන ලෙසත් සහන වශයෙන් ඉල්ලා සිටී.

වගඋත්තරකරුවන්ගේ ස්ථාවරය :-

01 වන වගඋත්තරකරුගේ ස්ථාවරය :-

පැමිණිලිකරු කො/හමීඩ් අල් - හුසේන් විදුහලේ විදුහල්පති තනතුරේ රාජකාරි ආවරණය කළ බවත් රාජ්‍ය සේවා කොමිෂන් සභා අනුමැතියෙන් ස්ථිර විදුහල්පතිවරයෙක් ලෙස පත්වීම් ලබාදුන් බැවින් පාසැලේ පරිපාලනය හා අධ්‍යාපනය සංවර්ධනය සාර්ථක කරගෙන යාම සඳහා පැමිණිලිකරු මල්වාන අල් - මුබාරක් ජාතික පාසැලට ස්ථාන මාරු කර ඇත. නැවත පැමිණිලිකරුගේ ඉල්ලීම මත ර/බලන්ගොඩ ජෙයිලානි


| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | 165,කිංසි පාර, කොළඹ - 08.<br>165, கின்சி வீதி, கொழும்பு - 08.<br>165, Kynsey Road, Colombo - 08. | සභාපති<br>தவிசாளர்<br>Chairman | 011-2696470 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2696470 | ඊමේල්<br>மின்னஞ்சல்<br>e-mail | sechrc@sltnet.lk |
|---|---|---|---|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94 - 11 - 2694925, 2685980, 2685981 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011-2689558 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 011-2689558, 1996 | වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk |

ජාතික පාසැලට ස්ථාන මාරු කළ බවත් එම පාසැලේදී වැඩ භාර ගැනීමේදී ඇති වූ ගැටලුකාරී තත්ත්වයක් මත පැමිණිලිකරු සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කිරීමෙන් පසුව ර/ආනන්ද මෛත්‍රී විද්‍යාලයට තාවකාලිකව අනුයුක්ත කර ඇතත් සබරගමුව පළාත් ලේකම් විසින් ර/බලන්ගොඩ විද්‍යාලෝක විද්‍යාලයට අනුයුක්ත කර ඇති අතර පසුව පැමිණිලිකරුගේ ඉල්ලීම මත නැවත බස්නාහිර පළාතට ස්ථාන මාරු කර ඇති බවයි.

රාජකාරී භාර ගැනීම සම්බන්ධයෙන් පැමිණිලිකරු වෙතින් විමසීමේදී 2014.11.01 දින සිට 2014.12.31 දින දක්වා අධ්‍යාපන කළමණාකරණ පශ්චාත් අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව සඳහා පූර්ණ කාලීන නිවාඩු ලබා ඇති බව දැන්වීම මත 2014.12.31 දිනෙන් බස්නාහිර පළාතේ රාජකාරී වාර්තා කරන ලෙස දැනුම් දී ඇත.

2014.07.14 දිනැති ලිපියෙන් පැමිණිලිකරු බස්නාහිර පළාතට නිදහස් කර ඇතත් රාජකාරී වාර්තා නොකිරීම මත 2015.02.20 දිනට පෙර රාජකාරරී වාර්තා නොකල හොත් නිසි ක්‍රියා මාර්ග ගැනීමට සිදුවන බව 2015.02.06 දිනැති ලිපියෙන් පැමිණිලිකරු වෙත දන්වා ඇති අතර, බස්නාහිර පළාතේ රාජකාරී භාර ගන්නා තුරු වැටුප් ගෙවීම කටයුතු සඳහා පැමිණිලිකරුගේ වැටුප කොළඹ කළාප කාර්යාලයට යොමු කරන ලෙස පාසැල වෙත දැනුම්දී ඇත.

පැමිණිලිකරු පළාත් පාසැලක නියෝජ්‍ය විදුහල්පති තනතුරක සේවය කිරීමට එකග වන්නේ නම් පමණක් බස්නාහිර පළාත් සේවයට බඳවා ගැනීමට බස්නාහිර පළාත් අධ්‍යාපන ලේකම් නිර්දේශ කර ඇති බැවින් නියෝජ්‍ය විදුහල්පති තනතුරක රාජකාරී භාර ගැනීමට පැමිණිලිකරු ලිඛිතව ප්‍රතික්ෂේප කර ඇති බව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් දැනුම්දී ඇත. එකී ලිපියට අනුව ජාතික පාසැල් සේවයේ සිටින පැමිණිලිකරු ආයතන සංග්‍රහයේ XXVIII වැනි පරිච්ඡේදයේ 5 ඃ 4 වගන්තියට පටහැනිව පළාත් බලධාරීන් වෙත ලිපි ඉදිරිපත් කර ඇති බවයි.

තවද ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 පන්තියේ නිලධාරියෙකු බැවින් පැමිණිලිකරුට සහකාර හෝ නියෝජ්‍ය විදුහල්පති තනතුරුවල සේවය කිරීම ප්‍රතික්ෂේප කිරීම සේවා ව්‍යවස්ථාව අනුව නොහැකි බැවින් බස්නාහිර පළාතට නිදහස් කිරීමට අනුව පැමිණිලිකරු වහාම බස්නාහිර පළාතේ රාජකාරී සඳහා වාර්තා කළ යුතු බවයි.

නිරීක්ෂණය ඃ-

පැමිණිලිකරුගේ 2013.11.13 දින දරණ ලිපිය අනුව ර/බලන්ගොඩ ජෙයිලානි පාසැලේ රාජකාරී භාරගැනීමට හිටපු විදුහල්පතිවරයා විරුද්ධත්වය ප්‍රකාශ කිරීම හා ආවේගශීලීව හැසිරීම සම්බන්ධයෙන් 2 වන වගඋත්තරකරු කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොමැති බවයි.

ඒ තුළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති සාමානාත්මතාවයේ අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බව නිරීක්ෂණය වේ.

නිර්දේශය ඃ-

01. පැමිණිලිකරුහට 2013.11.13 දින දරණ ලිපිය අනුව වැඩ භාර නොදීම සහ අවේග ශිලීව හැසිරීම සම්බන්ධයෙන් 2 වන වගඋත්තරකරු විසින් මාස 03 ක් ඇතුලත පියවර ගෙන එහි ප්‍රගතිය පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතුය.

02. පැමිණිලිකරු විසින් ඉහත (01) හි සඳහන් පියවර පිළිබඳ පරික්ෂණ අවසන් වන තෙක් බස්නාහිර පළාත් සභාවේ රාජකාරි භාර ගත යුතුය.

2018. 4. 27 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.